# පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වන

# ආචාරධර්ම සංග්‍රහය

# 2015

**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**අංක 330, යූනියන් පෙදෙස**

**කොළඹ 02.**

පටුන


1. පූර්විකාව
2. භූමිකාව හා රාජකාරී
3. පසුබිම
4. පොදු මූලධර්ම
5. බැඳියාවන් පිළිගැටුම
6. සබඳතාවයන් පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම
7. පොදු ආචාරධර්මීය යුතුකම් සහ වගකීම්
8. ආචාර ධර්ම සංග්‍රහය පිළිගැනීම සහ උල්ලංඝනය කිරීම
9. උපලේඛන

*a) පළමුවන උපලේඛනය - ආචාරධර්ම සංග්‍රහය පිළිගැනීම පිළිබඳ දිවුරුම හෝ සහතිකය*

*b) දෙවන උපලේඛනය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාව*

*c) තෙවන උපලේඛනය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ ව්‍යවස්ථාව*

## පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වන
## ආචාර ධර්ම සංග්‍රහය

## 1.
## පූර්විකාව

මෙය ............... පළාතේ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය වශයෙන් හඳුන්වනු ලැබේ.

මනාව ස්ථාපිත වූ නියෝජන මූලධර්ම සහ ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියකට හිමිකම් කියන ශ්‍රී ලාංකීය ජනතාව තුළ පළාත් සභාවන්ට තේරී පත් වූ ස්වකීය මන්ත්‍රීවරුන් කෙරෙහි දැඩි විශ්වාසයක් සහ ඉහල අපේක්ෂාවන්ද ඇත්තේය. රටෙහි පුරවැසියන්ට වගකිවයුතු වන සහ ස්වකීය මෙහෙවර තුළ විනිවිද භාවයකින් යුතුව කටයුතු කළ යුතු තනතුරක තමන් සිටින බව පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් අවබෝධ කර ගත යුතුය. පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපයෙහි අවසාන වගකීම තම ඡන්ද බල ප්‍රදේශයෙහි සිටින ඡන්දදායකයින්ගේ සුභසිද්ධිය වන අතර මැතිවරණවලදී ඔවුන් ධූරවලින් ඉවත් කිරීමේ අයිතියද ඡන්දදායකයන් සතු වේ.

අවංකභාවයෙන් සහ පරිපූර්ණත්වයෙන් යුතුව ස්වකීය රාජකාරි ඉටු කිරීම, රටෙහි සහ පළාත් සභාවෙහි නීති රීති වලට ගරු කිරීම, පළාත් සභා බල ප්‍රදේශය තුළ යහ පාලනය ප්‍රවර්ධනය කිරීම තුළින් ජනතාවගේ පොදු යහපත ළඟා කර ගැනීම සඳහා ස්වකීය දායකත්වය සැපයීමෙන් තමන් වෙත පවරා ඇති වගකීම පිළිබඳව පළාත් සභා මන්ත්‍රිවරුන් දැනුවත් විය යුතුය.

පළාතේ මහජන නියෝජිතයින් වශයෙන් ස්වකීය පළාත තුළ යහ පාලනය තහවුරු කිරීම සහ තුලිත මානව සංවර්ධනයක් ඇති කිරීමෙන් ජනතාවගේ සුබවිහරණය සහතික කිරීමට ඔවුන් වග බලා ගත යුතුය.

ස්වකීය ඡන්ද දායකයින්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම සඳහා පැවරී ඇති වගකීමක් පළාත් සභාවේ කටයුතුවලදී මෙන්ම සිය සාමාන්‍ය ජීවිතය තුළදී ස්වකීය රාජකාරීන් ඉටු කිරීමේදී ආදර්ශමත්ව හැසිරීම මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂා කෙරේ. තම පසුබිම සහ සිය පෞද්ගලික විශ්වාසයන් තුළ පවතින විවිධත්වය පිළිබඳ දැනුවත් වන අතරම ඔවුන් විසින් පළාත් සභාව සහ පළාතේ ජනතාව වෙනුවෙන් ස්වකීය පක්ෂපාතීභාවය නිසි අයුරින් පවත්වා ගෙන යා යුතුය.

මෙම ආචාර ධර්ම සංග්‍රහයේ අරමුණ වනුයේ, පළාත් සභාව, ඡන්දදායකයින් සහ මහජනතාව කෙරෙහි පවතින එකිනෙකට වෙනස් වූ වගකීම් පිළිබඳව මනා අවබෝධයක් ඇති කර ගැනීමට මන්ත්‍රීවරුන්ට සහාය වීමයි.

# 2.

## භූමිකාව සහ රාජකාරි

මන්ත්‍රීවරු විසින් ස්වකීය මූලික වගකීම් වශයෙන් පහත සඳහන් සම්මතයන් පිළිගනු ලැබේ.

(අ) කවර හෝ අදාල පෞද්ගලික බැදියාවන් ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය ඇතුළුව පෞද්ගලික හෝ මූල්‍යමය බැදියාවන් සැලකිල්ලට ගැනීමකින් තොරව විෂය මූලික ආකාරයෙන් ස්වකීය වගකීම ඉටු කිරීම.

(ආ) ස්වකීය බල ප්‍රදේශයේ සහ ඡන්දදායකයන්ගේ අපේක්ෂාවන් නියෝජනය කිරීම. එලෙස කටයුතු කිරීමේදී නීතියට ගරු කිරීමට සහ නීතියට අවනත වීම, තම පළාත් සභාවේ ගෞරවය ආරක්ෂා කිරීම, සියළු කටයුතුවලදී පෞද්ගලික අවංකභාවය සහ විශ්වාසය සහතික කිරීම තුළින් පොදු ජන යහපත කෙරෙහි ස්වකීය කැපවීම පවත්වා ගැනීම.

ස්වකීය ඡන්ද දායකයන් වෙනුවෙන් තීරණ ගැනීම සඳහා යුතුකමක් හා වගකීමක් තමන් සතුව පවතින බවට මන්ත්‍රීවරුන් දැනුවත් විය යුතු අතර ඒ වෙනුවෙන් ස්වකීය කැපවීම අවධාරණය කරමින් කටයුතු කල යුතුය. ඡන්දයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයන් වශයෙන් ඔවුන් කෙරෙහි මහජනතාව තබා ඇති විශ්වාසය පවත්වා ගැනීම සඳහා ස්වකීය කටයුතු වලදී මන්ත්‍රීවරුන් විසින් අවංකව ක්‍රියා කල යුතුය.

ශ්‍රී ලංකාවේ සියළුම පළාත් සභා මන්ත්‍රීවරුන් හට මෙම ආචාරධර්ම සංග්‍රහය අදාල වන අතර ඔවුන්ගේ වගකීම වනුයේ ස්වකීය හැසිරීම සහ ක්‍රියාවන් සැමවිටම ආචාර ධර්ම සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල වන බවට සහතික වීමය. මන්ත්‍රීවරයෙකු වශයෙන් ආචාරධර්ම සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනි කිසිවක් සිදු නොකිරීම ද ඒ සඳහා අනුබල නොදීමද වගකීම වන්නේය.

ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ පළාත් සභා මන්ත්‍රීවරුන් කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරයි. අදාල ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට මන්ත්‍රීවරුන්ට සහාය වීමේ වගකීමක් ද පළාත් සභාවේ වැඩ කටයුතු නිසි අයුරින් සිදුවන්නේද යන්න පිළිබඳව පරීක්ෂාවෙන් සිටීමට ද ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය වීම් පිළිබඳ චෝදනාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටද වගකීමක් පළාත් සභාව මෙන්ම එහි ප්‍රජාව සහ සියළුම පාර්ශවකරුවන් සතුව පවතී.

# 3.

## පසුබිම

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ වගකිව යුතු රාජ්‍ය පාලකයින්ගේ හැසිරීම පාලනය කරනු ලබන සුවිශේෂී වූ මූලධර්මයන් හා සමගාමීව මෙම ආචාරධර්ම සංග්‍රහය වැඩි දියුණු කොට ඇත. එබැවින් මෙම මූලධර්මයන් තුළින් අවධාරණය කොට ඇති අරමුණු සහ පරමාර්ථයන් අත්කර ගැනීමෙහිලා මෙම ආචාර ධර්ම පද්ධතිය ස්වයං මගපෙන්වීමක් සහ ස්වයං විධානයක් බවට පත් වනු ඇත.

මෙම මූලධර්ම නීතිමය යුතුකම් නොවුනද ඒවා මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳ එකඟතාවයන් සහ පිළිගත් සාමාජීය ආචාරධර්ම වශයෙන් සලකනු ලැබේ. කෙසේ වුවද මන්ත්‍රීවරුන් මෙම මූලධර්මයන්ට අනුව කටයුතු කිරීමට අපොහොසත් වනුයේ නම් එය ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමක් පමණක් නොව සාමාජීය අපේක්ෂාවන් කඩ කිරීමක් වන්නේය.

කිසියම් මන්ත්‍රීවරයෙකු, මහජන නියෝජිතයකු වශයෙන් තමාගේ ක්‍රියාකලාපය තුළින් තම අවංකභාවය, ආදර්ශමත්භාවය, විශ්වාසනීයභාවය ප්‍රශ්නකාරී සහ විවාදයට තුඩු දෙන කාරණයක් බවට පත්වන ආකාරයෙන් කටයුතු කරනුයේ නම් එය තම තනතුර සහ තමා සේවය සපයන ආයතනය අපකීර්තියට භාජනය කිරීමක් වශයෙන් සැලකිය යුතුය. එබැවින් තම තනතුරේ සහ ආයතනයේ කීර්තිනාමය ආරක්ෂා කිරීමේ වගකීමට තමා බැඳී සිටින බව මන්ත්‍රීවරයා අමතක නොකළ යුතුය.

## 4.

### පොදු මූලධර්ම

පළාත් සභා මන්ත්‍රීවරයෙකුට රාජ්‍යයේ ප්‍රජාතාන්ත්‍රික ව්‍යුහය තුළ ස්වකීය නියෝජිත භූමිකාව සහ වගකීම් පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගැනීමට සහාය දක්වන හා රාජකාරි සහ යුතුකම් පැහැදිලි කරනු ලබන සංකල්පයන් සහිත මෙම ආචාරධර්ම සංග්‍රහයට පහත දක්වා ඇති ප්‍රධාන මූලධර්මයන් ඇතුළත් වේ.

**දූෂණයෙන් තොර වීම**

දූෂණය තුලින් මන්ත්‍රීවරයෙකුගේ විශ්වාසනීයභාවය, අන්‍යයන් අතර පවතින කීර්තිය විනාශ වීම පමණක් නොව සමස්ථ පළාත් සභා ක්‍රමයම අපකීර්තියට පත්වේ. එබැවින් මහජනතාව විසින් පළාත් සභාව වෙනුවෙන් තෝරා පත් කරගනු ලැබූ මන්ත්‍රීවරයාගෙන් ජනතා විශ්වාසය පලුදු වන ආකාරයේ අවංක නොවූ ක්‍රියාවන් අපේක්ෂා නොකෙරේ.

**කැපවීම**

එබැවින් වෙනත් රැකියාවක නියුක්ත වීම සහ ව්‍යාපාර කටයුතු වලට සැලකිය යුතු කාලයක් කැප කිරීම ජනතා නියෝජිතයෙකු වශයෙන් ඉටු විය යුතු වගකීම් නිසි අයුරින් ඉටු කිරීමට බාධාවක් නොකර ගත යුතුය.

**රාජකාරිය / වගකීම්**

පළාත් සභා මන්ත්‍රීවරුන්, වගකීම පිළිබඳ මූලධර්මයට අනුකූලව කටයුතු කල යුතුය. ඉන් අදහස් වනුයේ ස්වකීය තීරණයන්ගෙන් බලපෑමට ලක්වීමට ඉඩ තිබෙන පාර්ශවයන් වෙත සාධාරණය ඉටු වන ආකාරයෙන් ක්‍රියා කල යුතු බවය.

නීති රීති සහ ප්‍රජාතාන්ත්‍රවාදී සම්ප්‍රදායන් පිළිගැනීම පිළිබඳ ඉමහත් සමාජ වගකීමක් සහ යුතුකමක් ඔවුන් සතුවේ. පළාත් සභාව විසින් සේවය සපයනු ලබන ප්‍රජාවගේ බලාපොරොත්තු ඉෂ්ඨ කිරීමේ වගකීමක් මන්ත්‍රීවරයෙකු සතු වන අතර සිය හෘද සාක්ෂියට අනුව මහජන අවශ්‍යතාවයන් සපුරාලීමට සහ ඔවුන් නියෝජනය කිරීමට වගකීමක් මන්ත්‍රීවරයෙකු සතු වේ.

පරාර්ථකාමී බව

පළාත් සභා මන්ත්‍රීවරයෙකු පෞද්ගලික, මූල්‍යමය සහ අනෙකුත් ද්‍රව්‍යමය වාසි අපේක්ෂාවෙන් තොරව මහජන අවශ්‍යතාවන් පෙරදැරි කොටගෙන කටයුතු කලයුතුය. මන්ත්‍රීවරයෙකුගේ හුදු වගකීම විය යුත්තේ මහජනතාවගේ අවශ්‍යතා මත පමණක් පදනම්ව තීරණ ගැනීම සහ විනිශ්චයන් ඇති කර ගැනීමයි.

අවංකභාවය

ප්‍රජා නියෝජිතයකු වශයෙන් මන්ත්‍රීවරයෙකු විසින් සිය හැසිරීම තුලින් ඍජු සහ අවංක ක්‍රියා කලාපයක් සහතික කළයුතු වන්නේය. එසේම අවංකභාවයකින් යුතුව සිය රාජකාරී කටයුතු ද ඉටු කිරීමට ඔහු බැඳී සිටින අතර පළාත් සභාව හෝ ජනතාව නොමඟ නොයන පරිදි කටයුතු කිරීමටද වග බලා ගත යුතුය.

මහජනතාවගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා හිතවත්භාවය,විශ්වසනීයභාවය, අවංකභාවය සහ සාධාරණත්වය සනාථ වන ලෙස මන්ත්‍රීවරයා ස්වකීය කටයුතු සිදු කළ යුතුය.

විෂය මූලික බව

කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම, පත්වීම් ලබා දීම, පුද්ගලයන් සඳහා විවිධ ප්‍රතිලාභ නිර්දේශ කිරීම යනාදී කවර හෝ රාජකාරී කටයුතු සිදුකරගෙන යාමේදී පළාත් සභා මන්ත්‍රීවරයෙකු විනිවිද හා සාධාරණ ලෙස කටයුතු කළ යුතුය.

තීරණ ගැනීමේ මට්ටමක සිටින විට ඔහු විසින් හුදෙක් අදාලවන කරුණු මත පමණක් පදනම් ව පොදු පරමාර්ථ සහ ප්‍රමුඛතාවයන් වෙනුවෙන් තීරණ ගැනීම අවශ්‍ය වන අතර, එවන් විටෙක කිසිදු ආකාරයකින් පෞද්ගලික සිතිවිලි සහ පෞද්ගලික පක්ෂපාතිත්වයන් මත කටයුතු නොකළ යුතු වන්නේය.

**වගවීම**

මන්ත්‍රීවරයෙකු ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වගකිව යුතු හවුල්කරුවෙකු වශයෙන් ස්වකීය තීරණ සහ ක්‍රියාකලාපය සම්බන්ධව පළාත් සභාවට, එහි ඡන්ද දායකයින්ට සහ පොදුවේ මහජනතාවටද වගවිය යුතු වේ.

පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ නිලය හුදෙක් ජනතා භාරයකි. තමන් සතු බලතල මගින් බලපෑම් කිරීමේ බලය නිත්‍යානුකූල සහ සාධාරණ අයුරින් භාවිතා කරන බවට සහතික විය යුතු අතර එම යුතුකම ඉටු කරන බවට පැහැදිලිව අනාවරණය විය යුතුය.

වගවීමේ මූලධර්මය තුලින් රාජකාරිමය තීරණ ගැනීමේදී අවංකභාවය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කරන අතර, දූෂණය වැලැක්වීම මෙන්ම යහපාලනය ස්ථාපනය කිරීමද සිදු වන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තම නියෝජිතයින් කෙරේ මෙන්ම පවත්නා පාලනය කෙරෙහිද මහජනතාවගේ විශ්වාසය ගොඩ නැගෙනු ඇත.

**භාරකාරිත්වය**

පළාත් සභා මන්ත්‍රීවරයෙකු මහජනතාව වෙනුවෙන් වඩා සාධනීය සේවයක් සැපයීම සඳහා පෞද්ගලිකව සහ සාමූහිකව කැපවිය යුත්තේය.

මහජනතාවගේ සුභසිද්ධිය සහ සෞභාග්‍ය වෙනුවෙන් පළාත් සභාව විසින් මනා සේවයක් සපයන ආකාරයට කටයුතු කලමනාකරණය කිරීම මන්ත්‍රීවරයාගේ වගකීම වන්නේය.

ඒ හේතුවෙන් ඔහු මහජන නියෝජිතයකු මෙන්ම ප්‍රජා නායකයෙකු වශයෙන්ද නීත්‍යානුකූලව, කාර්යක්ෂමව, ප්‍රවේශම් සහගත සහ ඵලදායී ආකාරයට පළාත් සභාව සතු වත්කම් සහ දේපල භාවිතා කිරීමට වගබලා ගත යුතු වන්නේය.

**විනිවිධභාවය**

මන්ත්‍රීවරයෙකු නිල රාජකාරිමය කටයුතු සිදු කිරීමේදි සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී හැකිතාක් දුරට විනිවිදභාවයකින් යුක්තව කටයුතු කල යුතුය. විනිවිදභාවය සහ ජනතා විශ්වාසය තහවුරු කිරීම උදෙසා අඛන්ඩ පදනමකින් යුතුව නිතියට අනුකූලව ස්වකීය වත්කම් හා බැරකම් අනාවරණය කිරීම, සෑම මන්ත්‍රීවරයෙකු විසින්ම සිදුකළ යුතු වන්නේය.

**නායකත්වය**

පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාට හිමිවන නායකත්වය, සහජ උරුමයක් නොවන බවත් එය හුදෙක් ප්‍රදේශයේ මහජනතාව විසින් තමා වෙත පවරා ඇති තත්වයක් බවත් අවබෝධ කර ගැනීම වැදගත් වේ. ඒ අනුව ජනතා පිළිගැනීම, විශ්වාසය සහ අගය කිරීම අඛන්ඩව පවත්වාගෙන යාම සාධනීය නායකත්වයක් උදෙසා අත්‍යවශ්‍ය වේ.

පළාත් සභාවේ මෙහෙවර සහ දැක්ම පිළිබඳව පැහැදිලි අවබෝධයක් මන්ත්‍රීවරයා තුල තිබිය යුතු අතර සිය ඡන්ද බල ප්‍රදේශයේ ප්‍රජාව සමග අඛන්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යා යුතුය.

**ස්වයං විනය**

මන්ත්‍රීවරයෙකු සිය සිතිවිලි සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පෞද්ගලික හික්මීමකින් කටයුතු කළ යුතු අතර, ස්වකීය හැඟීම් වැඩදායි අකාරයට හසුරුවා ගැනීමට සහ ප්‍රකාශ කිරීමට හැකියාව තිබිය යුතුය. ඔහු මනාව සංවිධානය වු පුද්ගලයෙකු විය යුතු අතර, අසීරුතාවයන් ඉදිරියේ වුවද නොසැලී අඛන්ඩව කටයුතු කිරීමට හැකියාව තිබිය යුතුය. බුද්ධිමත් සහ තාර්කික තීරණ ගැනීමේදී තමන් කෙරෙහි විශ්වාසය තැබිය හැකි බවට ස්වකීය අනුගාමිකයන් තුළ විශ්වාසය ගොඩනැගිය යුතුය.

**අන් අයට ගරු කිරීම**

මන්ත්‍රීවරයෙකු විසින් සියලුම මහජන නියෝජිතයින්ට මෙන්ම පළාත් සභා මන්ත්‍රීවරුන්ට මෙන්ම පළාත් සභාවේ කාර්යමණ්ඩල සාමාජිකයින්ට සහ සියලුම රජයේ සේවකයින්ට ඔවුන් විසින් සිදු කරනු ලබන රාජකාරින් පිලිබඳව ගරු කිරිමත් ඔවුන්ට ආචාරශීලීව සහ ගුණගරුක බවකින් යුතුව සැලකිමත් කල යුතුය. මන්ත්‍රීවරයා විසින් මහජනතාව වෙතද ඒ ආකාරයෙන්ම ගෞරවයක් සහ ආචාරශීලි භාවයක් දැක්විය යුතුය.

**ප්‍රවීණත්වය**

විෂයකරුණු පිළිබඳව පුළුල් දැනුමක් සහ අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් අංගයක් වේ.

මන්ත්‍රීවරුන් විසින් වෘත්තිය ප්‍රවීණත්වය, කාර්යක්ෂමබව සහ සාධනීයබව ඉහල මට්ටමකින් විදහා දක්වන සේ නීතියට අනුකූලව කටයුතු කල යුතුය.

# 5.

## බැදියා පිළිගැටුම

මන්ත්‍රීවරයෙකු වශයෙන් තමා වෙත ලැබී ඇති බලපෑම් කිරීමේ හැකියාව ස්වකීය පෞද්ගලික අවශ්‍යතාවයන් උදෙසා නොව පොදු ජන යහපත වෙනුවෙන් භාවිතා කිරීම යුතුකමකි. පෞද්ගලික බැදියාවන් පිළිබඳ ගැටුමක් පවතින බවට අන්‍යයන් තුල ඇතිවන අවබෝධය වලක්වාලීම සඳහා මන්ත්‍රීවරයා පෞද්ගලිකවම වගකීමක් දැරිය යුතුය. එවන් බැදියාවන් පිළිබඳ ගැටුම් මතුවීම වලක්වාලීම සඳහා කටයුතු සිදු කිරීමට උත්සාහ කළ යුතුය.

ස්වකීය නිල රාජකාරී කටයුතු සිදු කිරීමේදී අයුතු ආකාරයෙන් බලපෑම් කිරීමට හෝ එසේ වන බවට සාධාරණව සැලකිය හැකි පුද්ගලයන්ට හෝ ආයතනයන්ට අදාළව කිසිදු මූල්‍යමය බැඳීමකට තමා සම්බන්ධ නොවිය යුතුය.

රාජකාරිමය කටයුතු සිදු කිරීමේදී මන්ත්‍රීවරයෙකු විසින් පොදු ජන යහපත උදෙසා කටයුතු කළ යුතු අතර, පළාතේ ජනතාව වෙත වගකිව යුතු වේ. මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකාරකම් සහ තීරණ විනිවිදභාවයකින් විය යුතු අතර, මහජනතාවගේ විශ්වාසය ඒ තුළින් ආරක්ෂා විය යුතුය.පළාතේ ජනතාවගේ පොදු යහපත කරා ප්‍රවේශ විය හැකි ආකාරය පිළිබඳව අවංක, සාධාරණ සහ මනා දැනුවත් භාවයක් මත ස්වකීය තීරණ සහ ක්‍රියාකාරකම් සිදු කරන බව සහතික කිරීමට මන්ත්‍රීවරයෙකු උත්සාහ කළ යුතුය. බැදියාවන් පිළිගැටුමක් ඇති විය හැකි අවස්ථා වලදී ඒ බව කල් ඇතිව හෙළි කිරීම සෑම මන්ත්‍රීවරයෙකුගේම යුතුකම විය යුතු අතර එවැනි සියළු අවස්ථාවලින් වැළකී සිටීමද ඔහුගෙන් අපේක්ෂා කෙරේ.

## 6.

### සබඳතාවයන් පවත්වාගැනීම සහ වැඩිදියුණු කර ගැනීම.

**මන්ත්‍රීවරුන් අතර සබඳතාවයන්**

සියලුම මන්ත්‍රීවරුන්, පළාත් සභා රැස්වීම්, කමිටු රැස්වීම් සහ අනිකුත් රාජකාරි අවස්ථාවන්හිදී එකිනෙකාගේ ආත්ම ගෞරවය ආරක්ෂා වන පරිදි හැසිරිය යුතුය.

අනෙකුත් නියෝජිතයන් විසින්ද ඉදිරිපත් කරනු ලබන අදහස් හා යෝජනාවලට සැම විටම තම අවධානය ලබා දීමට සහ ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

**කාර්ය මණ්ඩලය සමග පවත්වන සබඳතාවය**

- මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරුන්ගේ කාර්යමණ්ඩලය පළාත් සභාවේ කාර්යමණ්ඩලය කෙරෙහි වෘත්තිය ආචාරශීලිභාවය සහ ගෞරවය දක්වමින් කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. ස්වකීය හැසිරීම සහ ස්වකීය කාර්ය මණ්ඩලයේ හැසිරීම තුලින් පළාත් සභා කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා සම්බන්ධයෙන් සාධාරණ සේවා සහ ආචාර ධර්මීය තත්ත්වයන් පවත්වාගනු ලබන බවට මන්ත්‍රීවරුන් විසින් සහතික විය යුතුය.

- මන්ත්‍රීවරුන් සියලුම නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ රාජකාරියට ගරු කළ යුතු අතර, ඔවුන් අතර දැඩි විශ්වාසය ගොඩනැගෙන ආකාරයට කටයුතු කල යුතුය.

- නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ රාජකාරිමය කටයුතු සම්බන්ධයෙන් ස්වකීය අදහස් අදාල දේශපාලන සහ පරිපාලන ප්‍රධානීන් වෙත දැනුම් දීමට පළාත් සභා මන්ත්‍රීන් සතුව අයිතියක් පැවතියද එම නිලධාරීන් කෙරෙහි අපහාසාත්මක ආකාරයෙන් කටයුතු කිරීමෙන් වැලකී සිටිය යුතුය.

- කවර හෝ නිලධාරියකුගේ නිත්‍යානුකූල රාජකාරීන් ඉටු කිරීමට බලපෑම් කිරීම, බාධා කිරීම, වලක්වාලීම හෝ ප්‍රමාද කිරීම සඳහා තුඩු දෙන කවර හෝ ආකාරයේ ක්‍රියාවක් මන්ත්‍රීවරුන් විසින් සිදු නොකළ යුතුය.

- පළාත් සභාව විසින් සිදුකරන ලබන වැඩසටහන් සාධනීය ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා මන්ත්‍රීවරුන් විසින් එහි කාර්යමණ්ඩලය සහ අනෙකුත් පාර්ශවයන් සමග උපරිම සහයෝගයෙන් කටයුතු කල යුතුය.

**ප්‍රජාව සමග පවත්වන සබඳතාවය**

සැලසුම් සහ යෝජනා මෙන්ම ස්වකීය අදහස් හා යෝජනා ද ඉදිරිපත් කිරීමට ජනතාව සතුව ඇති අයිතිය පිළිගත යුතුය. තවද සංවර්ධන සැළසුම් පිළියෙල කිරීමේදි ජනතාවගේ අදහස් යෝජනා ගැටළු හා ප්‍රශ්න සලකා බැලිය යුතුය.

**අනෙකුත් සංවිධාන / ආයතන සමග පවත්වන සබඳතාවය**

පළාත් සභා පරිපාලනයට සම්බන්ධ නොවූ කරුණක් සම්බන්ධයෙන් ජනතාවට අදාල ගැටලු අදාල බලධාරින්ගේ අවධානයට යොමු කල යුතුය.

පළාත් සභා මන්ත්‍රිවරුන් තම ප්‍රදේශයේ ජනතාවගේ පොදු යහපත සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් පිළිබඳව අවධානය යොමු විය යුතු අතර, ඒවා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යායුතුය.

## 7.

## පොදු ආචාරධර්මීය යුතුකම් සහ වගකීම්

පළාත් සභා මන්ත්‍රීවරයෙකු,

- ජනතාවගේ යහපත වෙනුවෙන් පමණක් යොමු වන ආකාරයකින් පොදු දේපල භාවිතා කල යුතුය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් කොට ඇති මූලික යුතුකම් ඉටු කිරීමට කටයුතු කල යුතුය. ( 2 වන උපලේඛනය)
- ජන ජීවිතය තුල සදාචාරය, අභිමානය ආචාරශීලීභාවය සහ අනිකුත් සමාජ හරයන් ඉතා ඉහල ප්‍රමිතියකින් පවත්වා ගෙන යාමට සහාය දිය යුතුය.
- ප්‍රජාව වෙත උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීමට සහ ඒවා ආරක්ෂා කරගැනීමට හැකි වන ආකාරයෙන් නීතිගරුක, අවංකව, අපක්ෂපාතීව සහ සාධනීය අයුරින් බුද්ධිමත්ව සහ විනිවිදභාවයකින් යුතුව ස්වකීය තනතුරෙහි වගකීම ඉටුකල යුතුය.
- සැම විටම තම ආත්ම ගෞරවය, ධූරයෙහි කීර්තිය සහ පළාත් සභාවෙහි කීර්තිය ආරක්ෂාවන ආකාරයට හැසිරිය යුතුය.
- රජය, පළාත් සභාව හෝ පළාත් පාලන සේවයේ පත්වීම්, උසස්වීම්,මාරුකිරීම් සිදුකිරීමට යම්පුද්ගලයෙකුගේ අපේක්ෂකත්වයට අනුග්‍රහය දැක්වීම සඳහා සිය රාජකාරිමය තනතුර භාවිතා කරමින් අනිසි බලපෑම් නොකල යුතුය. මේ මගින් තමා පෞද්ගලිකව දන්නා පුද්ගලයෙකු හෝ ආයතනයක් ආමන්ත්‍රණය කරමින් තමා පෞද්ගලිකව දන්නා යම් පුද්ගලයෙකු වෙත චරිත සහතිකයක් ලබා දීමෙන් මන්ත්‍රීවරයෙකු වලක්වාලීම අපේක්ෂා නොකෙරේ.
- ස්වකීය විශ්වාසනීයභාවය සහ අවංකභාවය ප්‍රශ්නකාරී වන කවර හෝ මූල්‍යමය හෝ වෙන යම් කටයුත්තක නිරත නොවිය යුතුය.
- තමා වෙත, කලත්‍රයා වෙත හෝ, පවුලේ සාමාජිකයකු හෝ තම හිතෛෂියෙකු වෙත ඍජුව හෝ වක්‍රව මූල්‍යමය හෝ වෙනයම් ප්‍රතිලාභයක් සැපයෙන ආකාරයෙන් සිය රාජකාරීමය කටයුතු හා ගැටෙන පරිදි කිසිඳු පුද්ගලයෙකු හෝ ආයතනයක් සමග එකඟතාවයකට නොපැමිණිය යුතුය.
- සිය රාජකාරිමය කටයුතු හා ගැටෙන පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යාම, හෝ තනතුරු දැරීම, වත්කම් හෝ කොටස් පවත්වාගෙන යාම නොකල යුතුය.

**තොරතුරු හෙළි දරව් කිරීම**

මන්ත්‍රීවරයෙකු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ ව්‍යවස්ථවෙන් හා 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි හෙළිදරව් නොකල යුතු තොරතුරු හැර අනෙකුත් තොරතුරු හෙළිදරව් කල යුතුය. (තෙවන උපලේඛනය)

**නීතියට අවනත වීමේ යුතුකම සහ වගකීම**

පළාත් සභා මන්ත්‍රීවරයකු විසින්;

- පළාත් සභාවට ලැබී ඇති ව්‍යවස්ථාදායක බලයට අනුකූලව ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු අතර මහා සභා හා කාරක සභා සඳහා සැම විටම සහභාගී විය යුතුය.

- තමා වෙත පැවරී ඇති බලතල වගකීම සහ අයිතිවාසිකම් වලට අනුකූලව සාමූහිකව කටයුතු කළ යුතු අතර පළාත් සභාවේ කාර්යය පටිපාටික රීති අනුව කටයුතු කිරීමට සැම මන්තවරයෙකුම සැම විටම බැඳී සිටිය යුතුය.

- පළාත් සභාවේ බලතල, ක්‍රියාකාරීත්වය, අධිකාරය, අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ අවබෝධයක් මෙන්ම පළාත් සභාවේ සහ එයට සම්බන්ධ අනෙකුත් ආයතනයන්ගේ කටයුතු පාලනය කරනු ලබන අදාල පනත්, ආඥා පනත්, ප්‍රඥප්ති, රීති, රෙගුලාසි, නියෝග සහ වෙනත් අදාල නීති පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ අවබෝධයක් තිබිය යුතුය. එසේම ස්වකීය රාජකාරි ඉටුකිරීමේදී එම නීති සහ උපනීතින්ට අනුකූලව කටයුතු කල යුතුය.

- ජනතාව වෙතින් ලැබෙන යෝජනා සහ පැමිණිලි භාරගැනීමට අවශ්‍ය කටයුතු පිළියෙල කල යුතු අතර කඩිනමින් යෝග්‍ය පිළිතුරක් ලබා දෙමින් ඒවා නිරාකරණය කල යුතු වන්නේය. එවන් අවස්ථාවලදී අපක්ෂපාතීව කටයුතු කල යුතුය.

**විදේශ සංචාර**

මන්ත්‍රීවරයෙකු විසින්;

ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යාවරයා, කැබිනට් මණ්ඩලය සහ පළාත් ආණ්ඩුකාරවරයා විසින් ලබා දෙනු ලබන විදේශ සංචාර පිළිබඳව රෙගුලාසි සහ නියමයන් පිළිබඳව දැනුවත් වී සිටිය යුතු අතර ඒවාට අනුකූලව කටයුතු කල යුතුය.

යම් විදෙස් සංචාරයකදී එයට අදාල වියදම් අදාල විදේශ රජය හෝ වෙනයම් සංවිධානයක් මගින් දරනු ලබන අවස්ථා ද ඇතුළුව විදේශීය රජයකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ආයතනයකින් විදෙස් සංචාර සඳහා ලැබෙන ආරාධනාවක් පිළිගැනීමට ප්‍රථම මන්ත්‍රීවරයා විසින් අදාල විදෙස් සංචාරය පිළිබඳ සියලු තොරතුරු ඇතුලත් කරමින් ප්‍රමාණවත් දැනුම් දීමක් විධිමත් ආකාරයෙන් පළාතේ ආණ්ඩුකාරයා වෙත සිදුකර අනුමැතිය ලබා ගත යුතුය.

සෑම නිල විදෙස් සංචාරයක්ම අවසන් කොට පැමිණීමෙන් පසුව කඩිනමින් ඒ පිළිබඳව පූර්ණ විධිමත් වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කල යුතුයි.

විදෙස් සංචාර තුලින් ලබන අත්දැකීම් සහ දැනුම පළාත් සභාව විසින් සපයනු ලබන සේවාවන්ගේ  ගුණාත්මක හරය වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කල හැකි අවස්ථාවලදී මන්ත්‍රීවරුන් සහ පළාත් සභාවේ කාර්යය මණ්ඩලය සමඟ බෙදා හදා ගැනීම සඳහා සම්මන්ත්‍රණ සහ සාකච්ඡා මගින් පියවර ගත යුතුය.

නිල විදේශ සංචාරයකදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මන්ත්‍රීවරයාගේ විනයගරුකබව හා හැසිරීම ආදර්ශ සම්පන්නව පවත්වා  ගතයුතු අතර එවන් අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කීර්ති නාමය වඩා වර්ධනය කර ගැනීමට හේතුවන ආකාරයෙන් ක්‍රියා කල යුතුය.

ශ්‍රී ලංකාව තුළදී හෝ මන්ත්‍රීවරයා සංචාරය කරනු ලබන කවර හෝ විදේශ රටකදී තමාගේ අවංකභාවය සහ ඍජුභාවය ආරක්ෂා වන ආකාරයෙන් ක්‍රියා කල යුතුය.

**ත්‍යාග සහ ප්‍රදානයන්**

පළාත් සභා මන්ත්‍රීවරයෙකු විසින්;

තමාගේ නිල රාජකාරි කටයුතු කෙරෙහි ඍජුව හෝ වක්‍රව බලපෑමක ඇති කරන්නා වූ ත්‍යාගයක් හෝ ප්‍රදානයක් ඉල්ලා සිටීම හෝ භාර ගැනීම නොකළ යුතුය.

කවර හෝ ආකාරයේ ප්‍රතිලාභයන් හෝ අනුග්‍රාහකත්වයන් භාර ගැනීම තුළින් තමාගේ නිල රාජකාරි කටයුතු කෙරෙහි යම් පුද්ගලයෙක් හෝ යම් ආයතනයක් බලපෑම් සිදු කොට ඇති බව ගම්‍ය වන ආකාරයේ අවස්ථාවන්හි නිරත වීමෙන් මන්ත්‍රීවරයා වැලකී සිටිය යුතුය.

තමා වෙනුවෙන්, ඔහුගේ කලත්‍රයා, දරුවන් ළගම ඥතීන් හෝ කාර්ය මණ්ඩල නිළධාරීන් නීති විරෝධී ආකාරයෙන් ප්‍රතිලාභ අනුග්‍රාහකත්වයන් හෝ ප්‍රදානයන් ලබා නොගන්නා බවට වග බලා ගත යුතුය.කොන්ත්‍රාත් ලබා ගැනීමට අපේක්ෂා කරන ආයතනය හෝ පුද්ගලයන් වෙතින් ඍජුව හෝ වක්‍රව නීති විරෝධී වාසි ලබා නොගත යුතුය.

**පිළිගැනීම සහ සත්කාරය**

මන්ත්‍රීවරයෙකු විසින්;

තමාගේ නිල රාජකාරිමය හැකියාවන් මත ආරාධනය කරනු ලබන අවස්ථාවන් හැරුණු කොට විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් හෝ ජාත්‍යන්තර සංවිධාන හෝ එවන් සංවිධාන වල සාමාජිකයන්ගෙන් ලැබුණු රාජතාන්ත්‍රික සම්මාන, පිළිගැනීම හෝ වෙනත් ආකාරයේ අනුග්‍රහයන් පිළිගැනීම සහ ඒවාට අනුබල දීම නොකළ යුතුය.

රාජතාන්ත්‍රික හෝ නිල පිළිගැනීම් හෝ වෙනත් යම් උත්සව අවස්ථාවන් වලදී මෙම ආචාර ධර්ම සහ ගෞරවාන්විත හැසිරීම ආරක්ෂා කර ගත යුතුය.

විදේශීය ආරාධනා පිළිගැනීම හෝ එවන් අවස්ථාවන්ට සහභාගී වන විට ශ්‍රී ලංකාවේ හෝ පළාත් සභාවෙහි හෝ මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට යම් හානියක් සිදු වීම වළක්වාලීම සඳහා ස්වකීය ප්‍රඥාව භාවිතා කරමින් කටයුතු කල යුතුය.

- රාජකාරි කටයුත්තක් ඉටු කිරීම සඳහා හැර නීති විරෝධි සූදු සහ ඔට්ටු දැමීමේ කටයුතු සඳහා අවස්ථාව සපයා තිබෙන සමාජ ශාලා හෝ වෙනත් එවන් ආයතන සමග සබඳතා නොපැවැත්විය යුතුය.

**පළාත් සභාවේ දේපල සහ සේවාවන්**

පළාත් සභා මන්ත්‍රීවරයෙකු විසින්

- තමාගේ හෝ වෙන යම් පුද්ගලයෙකුගේ පෞද්ගලික ප්‍රතිලාභය සඳහා නිල නිවාස, බඩු බාහිරාදිය, යාන වාහන සහ පොදු දේපල භාවිතයට ගැනීම සඳහා නිසි අවසරයක් ලැබී ඇත්තේ නම් මිස එවන් දේපළ භාවිතා නොකළ යුතුය.

- **පළාත් සභාවේ තීරණ**
  - පළාත් සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයෙකු විසින් පළාත් සභාව තුළදී අන් අයගේ අදහස් වලට ගරු කරමින් වගකිව යුතු ආකාරයෙන් හැසිරිය යුතු අතර තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තම ඡන්දය ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම ප්‍රධාන විකල්ප ක්‍රියාමාර්ග සහ කරුණුවල අදාලතාවය පිලිබඳ ගැඹුරින් අධ්‍යයනය කළ යුතුය.

**ප්‍රජා වගකීම**

පළාත් සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයා තමා විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සහ කාර්යභාරයන් සම්බන්ධයෙන් සහ ගනු ලබන තීරණ සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ ප්‍රජාව වෙත වගකිව යුතු වේ. මන්ත්‍රීවරයාගේ නිල ක්‍රියාකාරකම් සම්බන්ධ කටයුතුවලදී යම් විමර්ශන කටයුත්තක් සිදු වන්නේ නම් ඒ සඳහා සහාය ලබා දිය යුතුය.

## 8.

## ආචාර ධර්ම සංග්‍රහය පිළිගැනීම සහ උල්ලංඝනය කිරීම.

ආචාර ධර්ම සංග්‍රහය පිළිගැනීම

පළාත් සභාවේ සියලුම මන්ත්‍රිවරුන් මෙම ආචාර ධර්ම සංග්‍රහය ඉතා පරෙස්සමෙන් කියවා එහි අන්තර්ගතය අවබෝධ කර ගැනීමෙන් පසුව එය තමන් පිළිගන්නා බව ප්‍රකාශයට පත් කරමින් සභාපතිවරයා ඉදිරියේ දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥා දීමක් සිදු කල යුතුය.

මෙම ආචාර ධර්ම සංග්‍රහය පළාත් සභාවේ අනෙකුත් අදාල නීති, ප්‍රඥප්ති, ව්‍යවස්ථා නියමයන් සහ ස්ථාවර නියෝගයන්, රීති සහ සම්මතයන් සමග ඒකාබද්ධව අවබෝධ කර ගත යුතුය.

පළාත් සභාවේ සභාපතිවරයා සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මගින් මෙම ආචාර ධර්ම කඩවීම පිළිබඳ සිදුවීම් පිලිබඳ සලකා බැලීම සිදු කෙරේ.

ආචාර ධර්ම උල්ලංඝනය වූ බවට චෝදනාවට ලක් වූ අවස්ථාවන් ආචාර ධර්ම සහ වරප්‍රසාද කමිටුව වෙත යොමු කරනු ලැබෙන අතර සභාව විසින් අනුමත ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමෙන් පසුව ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය වී ඇති බවට සනාථ කරනුයේ නම් සභාව අනුමත කරනු ලබන තීරණයක් ගත හැකි වන්නේය.

**පළමු උප ලේඛනය**

ආචාර ධර්ම සංග්‍රහය පිළිගැනීම ප්‍රකාශ කරමින් දෙනු ලබන දිවුරුම හෝ ප්‍රතිඥාව .................................................................................................................. වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට අනුකූලව, මන්ත්‍රී ධූරයෙහි රාජකාරි විශ්වසනීය අයුරින් සිදු කරන බවටත්, කාර්යභාරය ඉටුකරන බවටත් සහ පළාත් සභාවේ නීතිය පිළිගන්නා බවටත් පළාත් සභාවට විශ්වාසවන්තව කටයුතු කරන බවටත් පළාත් සභාවේ අධිකාරය යටතේ පවතින ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කරන බවටත් ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි / දිවුරුම් දෙමි.

**දෙවන උප ලේඛනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාව

| | |
|---|---|
| මූලික යුතුකම් | 28.අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ක්‍රියාත්මක වීමත් භුක්ති විඳීමත් යුතුකම් හා බැඳීම් ඉටු කිරීමෙන් වෙන්ව පැවතිය නොහැක්කේය :- එහෙයින්<br><br>(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නිතිය ආරක්ෂා කොට අනුගමනය කිරීමද,<br><br>(ආ) ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීමද,<br><br>(ඇ) තමන් විසින් තෝරා ගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟව නොපිරිහෙලා වැඩ කිරීම ද,<br><br>(ඈ) පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමද, පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම ද, |

| | |
|---|---|
| | (ඉ) සෙසු අයගේ අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ගරු කිරීම ද,<br><br>(ඊ) ස්වභාව ධර්මය සහ ස්වභාවික සම්පත් රැක ගැනීම ද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය. |

තෙවන උප ලේඛණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ ව්‍යවස්ථාව

**තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම**

14 අ. (1) සෑම පුරවැසියෙකුටම -

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මඟින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයෙකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාරතමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මඟින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නා වූ ;

සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ) , (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළ වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ , සහ පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේය.

(2) ජාතික ආරක්ෂාව , භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිසද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිසද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසද , අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිසද , පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිසද , අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිසද , පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිසද හෝ අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිසද , ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමා කිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේය.

(3) මේ ව්‍යවස්ථාවේ " පුරවැසියා" යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.